ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT
නො: 07, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07.
இல: 07, ஹெக்டர் கொப்பெகடுவ மாவத்தை, கொழும்பு 07.
No: 07, Hector Kobbekaduwa Mawatha, Colombo 07.

ෆැක්ස් / பெக்ஸ் / Fax — 2684051
ඊමේල් / ஈ-மெயில் / E-mail — landcom@landcommdept.gov.lk

මගේ අංකය / எனது இல / MY NO — 5/2/6/රන්බිම චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / YOUR NO —
දිනය / திகதி / DATE — 2011.06. 22

<u>චක්‍රලේඛ අංක - 2011/03</u>

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර සකස් කිරීම.</u>

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිරූප අත්සනින් නිකුත් කරනු ලබන රන්බිම දීමනාපත්‍ර වල ගුණාත්මකභාවය උසස් මට්ටමින් තිබීමෙ වැදගත්කම නැවතත් අවධාරනය කරමි. ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් මෙම දීමනාපත්‍ර සකස් කර එවීමේදී නිරන්තරයෙන් දැකිය හැකි දෝෂ පිලිබඳව පෙන්වා දෙමින් වරින්වර චක්‍රලේඛ ගණනාවක් නිකුත් කර ඇතත් තවදුරටත් එවැනි දෝෂ සැලකිය යුතු ප්‍රමාණයක් එදිනෙදා වාර්ථා වන බව පෙනී ගොස් ඇත. එමනිසා ඒවා ආපසු හරවා යවා නිවැරදි කර ගෙන්වා ගැනීමට සිදුවීමෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලත්, පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලවලත් මෙම දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩල වල ශ්‍රමය හා කාලය අනවශ්‍ය ලෙස අපතේ යැමක් ද දීමනාපත්‍ර නිකුත් කිරීමට ගතවන කාලය අනවශ්‍ය ලෙස දීර්ඝවීමෙන් දීමනාපත්‍රලාභීන් අපහසුතාවට පත්වීමක් ද සිදුවේ.

මෙම දෙපාර්තමේන්තුවේ අත්දැකීම අනුව පහත සඳහන් අඩුපාඩු හෝ දෝෂ තවදුරටත් නිරන්තරයෙන් දක්නට ලැබෙන බව ඔබේ විශේෂ අවධානයට යොමු කරවමි.

01. අතිගරු ජනාධිපතිතුමාගේ නම දීමනාපත්‍රයේ නිවැරදිව සඳහන් නොකිරීම.
02. දීමනාපත්‍රකරුගේ නම සහ ලිපිනය නිවැරදි නොවීම.
03. ජීවිතභුක්තිකරු මුල් අයිතිය ලැබෙන සේ දීමනාපත්‍රය සකස්කර තිබීම.
04. දීමනාපත්‍රයේ අනුපිටපත් ඇතුළත් නොවීම.
05. දීමනාපත්‍රය යතුරුලියනය කිරීම හෝ පරිඝනක මුද්‍රනය නොකර අතින් ලියා තිබීම.
06. ටිපෙක්ස් භාවිතයෙන් දීමනාපත්‍රයේ සංශෝධන සිදුකර තිබීම.
07. බලපත්‍ර පිටපත එවා නොතිබීම.
08. වාර්ෂික අවසර පත්‍ර ඉඩම් සඳහා දීමනාපත්‍ර සකස් කර තිබීම.
09. බලපත්‍රයේ නිලධාරියා අත්සන් කර මුද්‍රාව තබා නොතිබීම.
10. බලපත්‍රයේ 20 'අ' අනුමැතිය හෝ ඉඩම් කච්චේරි පැවැත්වීමේ අනුමැතිය පිළිබඳ සටහනක් ඇතුළත් නොවීම.

11. බලපත්‍ර නිකුත් කිරීමේදී නිසි පරිදි තෝරාගත් බවට ප්‍රාදේශීය ලේකම් ගේ සහතිකය නොතිබීම.

12. බලපත්‍ර පිටපත සත්‍ය පිටපතක් බවට නිසි පරිදි සහතික කර අත්සන හා මුද්‍රාව තබා නොමැතිවීම.

13. බලපත්‍රයේ හා දීමනාපත්‍රයේ අයිතිකරුගේ නම වෙනස් වීම.

14. බලපත්‍රකරුගේ නිසි අත්සන නොමැතිව සංශෝධනය කර තිබීම.

15. බලපත්‍රයේ හා දීමනාපත්‍රයේ සඳහන් ඉඩමේ ප්‍රමාණය වෙනස් වීම.

16. බලපත්‍රයේ සමහර වැදගත් කරුණු සටහන්ව නොතිබීම.

17. රේඛා චිත්‍රයේ පවතින අඩුපාඩු.

18. පළමු උපලේඛනය සම්පූර්ණ කිරීමේදී පවතින දෝෂ.

19. දෙවන උපලේඛනය සම්පූර්ණ කිරීමේදී පවතින දෝෂ.

ඉහත සඳහන් අඩුපාඩු නිවැරදි කිරීම සඳහා නිකුත් කරනු ලැබූ පහත සඳහන් චක්‍රලේඛ උපදෙස් නිසි පරිදි පිළිපදින ලෙසත් ඒ පිළිබඳව මෙම කාර්යයේ යෙදී සිටින රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන් සහ වෙනත් නිලධාරීන් නිසි පරිදි දැනුවත් කරන ලෙසත් නැවතත් අවධාරණය කරමි.

(i) ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2007.11.07 දිනැති අංක 5/2/6/රන්බිම චක්‍රලේඛ, දරණ චක්‍රලේඛය.

(ii) ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2007.11.11 දිනැති අංක එල්ඩී/12/1/1/29 දරණ චක්‍රලේඛය.

(iii) ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2009.10.06 දිනැති අංක 5/2/6/රන්බිම චක්‍රලේඛ, දරණ චක්‍රලේඛය.

(iv) ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2010.03.12 දිනැති අංක 5/2/6/2009 දරණ චක්‍රලේඛය.

(v) ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2009.06.17 දිනැති අංක 2009/03 දරණ චක්‍රලේඛය.

ඉහත චක්‍රලේඛ ද ඇතුළුව ඉඩම් විෂයයට අදාළව පසුගිය කාලය තුළ නිකුත් කරනු ලැබූ චක්‍රලේඛ එකතු කර සීඩී තැටියක් මගින් බොහෝ ප්‍රාදේශීය ලේකම්වරුන්ට දැනටමත් ලබාදී ඇත. තවදුරටත් මෙම චක්‍රලේඛ පිටපත් ඔබට අවශ්‍ය වන්නේ නම් ඉල්ලීමක් කළහොත්, (දුරකථනයෙන් හෝ) පිටපත් සාමාන්‍ය තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් ඔබ වෙත එවීමට කටයුතු කළ හැක.

තවද මෙම කරුණු සම්බන්ධයෙන් විධිමත් අවබෝධයක් ඔබ කාර්යාලයේ මෙම කටයුතු වල නියුතු නිලධාරීන්ට ලබාදීමට අවශ්‍ය යයි හැඟේ නම් ඒ සඳහා ද ඉල්ලීමක් කළහොත් අවස්ථාව ලබාදිය හැකි බව සලකන්න.

මෙ කරුණු සම්බන්ධයෙන් ඉහළම අවධානය යොමු කර රන්බිම දීමනාපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමටත් එහි ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමටත් ඔබේ දායකත්වය ලබාදෙන ලෙස වැඩිදුරටත් දන්වමි.

ආර්. පී. ආර්. රාජපක්ෂ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් -
01. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - දැ. ගැ. ස.
02. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් - අ. ක. ස.
03. සියළුම අන්තර් පළාත් / නියෝජ්‍ය / සහකාර ඉඩම් කොමසාරිස්වරුන් - අ. ක. ස.